සන්නස

**Sannasa**
244 Princes Hwy
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
**www.sannasa.com**
email :sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241**after 4pm**

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සංස්කරණ උපදේශක / Editorial Advisor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රචා / Graphics**
ශානලී එදිරිසිංහ Shanalee Edirisinghe

**වෙළඳ දැන්වීම් / Advertising**

**S Jayasinghe**
03 8707 4604
0402 025 516
email- sjturaus@optusnet.com.au

**Kuma Gamage**
0414 215 280
email- ads.sannasa@gmail.com

**Account Details for Payments**

| | |
|---|---|
| **Account Name** | **- Sannasa Media** |
| Bank | - Westpac |
| BSB Number | - 033 341 |
| Account Number | - 590847 |

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වී ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සේයා රූ / Photography**
Prasanna Kurukularatna

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku

**QLD**
Ananada Samaratunga
2, Santorini Pl.
Forest Lake
QLD 4078
(07) 3372 7958

**WA**
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhdist Vihara

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**SA**
Chandra Eeriyagama
08 8331 2318


පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත







## වසර දහයක් අවසානයේදී

මේ සන්නසේ දහවන වසරේ අන්තිම කළාපයයි. වසර දහයක් සම්පූර්ණ කළ සන්නස මේ දක්වා ආ ගමන දෙස ආපසු හැරී බලන අපට අප ආ ගමන පිළිබඳ යම් කිසි නිහතමාණී සතුටක් දැනෙයි. අතිශය දුෂ්කර අතිශය වෙහෙසකාරී මේ ගමන රළු ගල් මුල් උඩින් පැන ආ දුෂ්කර ගමනක් බව අමුතුවෙන් ලිවිය යුතු නැත. මෙවන් ගමනක් එන්නනට අපට හැකි වුණේ අපේ ආදරණීය පාඨකයන් වන ඔබ ලබා දුන් ධෛර්යය නිසයි.

එනමුදු අපට ඉටුකරගන්නට අවශ්‍ය වූ මූලික අරමුණක් වූ විරුද්ධ මත ඉවසා සිටින්නට හැකි පාඨක සමාජයක් බිහි කරලීම කෙතරම් දුරට සාර්ථක වූවාද යන්න ගැටලුවකි. තමන් දරන, විශ්වාස කරන, අදහන, මතයට විරුද්ධ මතයක් යම් කිසිවකු ප්‍රකාශ කරන විට ඒ මතයට ගරු කරන්නටත් ඒ මතය ඉවසා සිටින්නටත් පුරුදු පුහුණු වූ පාඨක සමාජයක් දැකීම අපේ අභිප්‍රායයි. ඒ සඳහා අවශ්‍ය වන ප්‍රඥාව සැමටම ලැබේවායි මේ මොහොතේදී පතන්නට අපි කැමැත්තෙමු.

## ක්‍රිකට් වසන්තය

ශ්‍රී ලාංකිකයන් වශයෙන් අපට සතුටු වන්නට ආඩම්බරයක් වන්නට හැකි විශාලම කාරණයක් වන්නේ ලෝකය හමුවේ දිනෙන් දින ඉදිරියට යන අපේ ක්‍රිකට් ක්‍රීඩාවයි. වැටෙමින් නැගිටිමින් වුවද මේ යන ගමන අතිශය ආශ්වාදජනක එකකි. අපේ ක්‍රීඩකයෝ අද දවසින් දවස ක්‍රිකට් ක්‍රීඩාවෙන් ලෝක වාර්තා තබන්නේ රටට අති විශාල ගෞරවයක් ලබා දෙමින්ය. ඒ ආශ්වා දය රටටමය.

මෙවන් වූ ක්‍රිකට් ක්‍රීඩාවේ ඉදිරිය වෙනුවෙන් ඇති සැළසුම් පිළිබඳව අපට සතුටු විය හැකිද? අප දකින ආකාරයට නම් ක්‍රීඩාවේ ඉදිරිය වෙනුවෙන් කිසිදු වැදගත් සැළසුමක් කෙරී නැත. අපේ ක්‍රිකට් කීඩාවේ අද දවස දිදුලන එකක් වුවද එහි අනාගතය සුබ නැති බව ඕනෑම කෙනෙකුට පෙනී යන සත්‍යයකි.

පසුගිය කාලය පුරාවටම මේ ක්‍රීඩාව පැවතුණේ දේශපාලකයන්ගේ බලපෑම් වල අනිටු විපාක විඳ ගනිමින්ය. මේ විශාල ධන උල්පත තම තමන්ගේ සාක්කු වලට හරවා ගන්නා අන්දම ගැන සැළසුම් සෑදුවා මිස ක්‍රීඩාවේ දියුණුව වෙනුවෙන් සැළසුමක් කළ කෙනෙක් නැත.

ඒ අවාසනාවන්ත යුගය හමාර කර වැදගත් හරවත් සැළසුම් සහිතව ඉදිරියට යාමට දැන් කාලය එළැඹ තිබේ. ඒ සඳහා වූ බුද්ධිය පාලකයන්ට ලැබේවායි පතමු.

## ජාතිවාදය එපා

බල තන්හාව වෙනුවෙන් ඉතා නිර්ලජ්ජී ලෙස අද දවසේ ජාතිවාදය අවුස්මින් තිබෙන ආකාරය දැකීම ඉතාම කණගාටුදායකය, පටු දේශපාලන වාසි ලබාගැනීම සඳහා සහ බලය ලබා ගැනීමේ කෙටි මගක් ලෙස මිනිසුන්ගේ සිත් තුළ ජාතිවාදයේ ගිණි ඇවිලවීම කිසි ලෙසකින්වත් අනුමත කළ හැකි ක්‍රියාවක් නොවේ

ශ්‍රී ලංකාව් ජාතිවාදයෙන් ඇති තරම් බැට කෑ රටකි. දැන් අවශ්‍යව ඇත්තේ ජාතීන් අතර සංහිඳියාව ඇති කරන සහජීවනය ඇති කරන එකමුතු බව ඇති කරන පැහැදිළි වැඩ පිළිවෙලක් ක්‍රියාවට නැංවීමයි. එසේ තිබියදී ජනතාව විසින් ප්‍රතික්ෂෙප කරන ලද බල තණ්හාවෙන් පීඩිත දේශපාලකයන් විසින් අවුලවමින් යනු ලබන මේ ගිනි පුපුරු විශාල ගිණි ජාලාවක් වී නැවත වතාවක් අපේ දේශය වෙළා ගනු දැකින්නට කිසිවකු කැමති නොවනු ඇත.

බලය ලබා ගත යුත්තේ පැහැදිළි දේශපාලන ක්‍රියාවලියක් තුළිනි. ජනතා විශ්වාසය දිනා ගැනීම තුළින්ය. එසේ නැතිව මහජනතා සිත් සතන් තුළ සැකය අවිශ්වාසය ඇති කර එතුළින් සිය අරමුණු සාක්ෂාත් කර ගැනීමට යාම රටට කරන විනාශයකි. ඒ විනාශය කරන්නට මේ වියරු බලවේග වලට ඉඩ නොදිය යුතුය. ඒ සඳහා මහජන බලය එක් රැස් කරලීම අද දවසේ වැදගත්ම කාර්යයක් වෙයි.

**සංස්කාරක**